# වේවැල්කැටිය ශිලා ලේඛනයෙන් පිළිබිඹු වන තත්කාලීන අධිකරණය පිළිබඳ විමර්ශනයක්

කේ.ඒ. උදයංගනී*

කිසියම් රටක ඉතිහාස තොරතුරු විමර්ශනය කිරීමේ දී පුරාවිද්‍යාත්මක මූලාශ්‍රවලින් ලැබෙන දායකත්වය සාහිත්‍යයික මූලාශ්‍රවලින් ලැබෙන දායකත්වයට වඩා නිවැරදි මෙන් ම විශ්වාසනීයත්වයෙන් ද යුක්ත ය. ලාංකික ඉතිහාසයේ පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර හතරකි. එනම් ශිලා ලිපි, පුරාණ කාසි, ස්මාරක, මූර්ති කැටයම් හා චිත්‍ර යනුවෙනි. මේවායින් ශිලා ලේඛන මූලාශ්‍රය වැදගත් තැනක් ගනී. ලෙන් ලිපි, ගිරි ලිපි, ටැම් ලිපි, පුවරු ලිපි, හා වෙනත් ලිපි යනුවෙන් ශිලා ලිපි ප්‍රධාන කොටස් පහක් වන අතර වේවැල්කැටිය ලේඛනය පුවරු ලිපියකි. පැරණි ලක්දිව සමාජ සංවිධානයෙහි ව්‍යුහාත්මක ස්වරූපය විමසීමේ දී නීතිය හා අධිකරණය පිළිබඳ සෙල්ලිපිවලින් හෙළි වන කරුණු වැදගත් ය. ව්‍යවස්ථාදායකයේ විධායකයේ මෙන් ම අධිකරණයේ ද ප්‍රධානියා වූයේ රජතුමා ය. රජු කේන්ද්‍ර කොටගෙන පැවති අධිකරණ බලය අනුරාධපුර යුගයේ අවසන් සමය වන විට ප්‍රාදේශීය අධිකරණ ශාලා වෙත පවරා තිබිණි. ක්‍රි. ව. දහවන සියවසට අයත් වේවැල්කැටිය ශිලා ලේඛනය හතර වන මිහිඳු රජුගේ රාජ්‍යය සමයේ (ක්‍රි.ව. 975) කරවූවකි. එය 1875 දී ගෝල්ඩ් ස්මිත් පඬිවරයා විසින් සොයා ගන්නා ලදී. අනුරාධපුරයේ සිට සැතපුම් විසි එකක් පමණ ඊශාන දෙසින් කැන්දා කොරළයේ පහළ කැන්දැ තුලානට අයත් වේවැල්කැටිය ගමෙන් සොයාගත් සෙල්ලිපිය වේවැල්කැටිය පුවරු ලිපියයි. නීතිමය අධිකරණ ව්‍යවස්ථාවක් ඇතුළත් කර තිබීම මෙම ලිපියේ විශේෂත්වයයි. අධිකරණ බලතල සහ ඒවා ක්‍රියාත්මක වූ ආකාරය, තීන්දු තීරණ ගැනීමේදී අනුගමනය කළ ක්‍රියාමාර්ග, නීතිය ක්‍රියාත්මක කරවන අයට සහ එසේ නොකරන අයට අදාළ නීති ක්‍රමවේද මෙහි දක්වා ඇත. අධිකරණය හා අත්‍යන්තයෙන් බැඳී පැවතුණු දඬුවම් ක්‍රම ද මෙම ශිලා ලේඛනයේ අන්තර්ගත වේ. මරණ දඬුවම, අත් පා කැඩීම, හංවඩු ගැසීම, රත් කළ යකඩ පාවහන් මත නැංවීම, පිටිවහල් කිරීම ඒ අතර ප්‍රධාන වේ. වේවැල්කැටිය ශිලාලේඛනයේ සඳහන් නෛතික රාමුව සහ දඬුවම් ක්‍රම අනුව එකල ලංකාවේ දරුණු පාලන ක්‍රමවේදයක් ක්‍රියාවට නැංවූයේද? පිළිබඳවත් අවධානය යොමු කරමින් වේවැල්කැටිය පුවරු ලිපිය ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් ද සඟරා, පුවත් පත් ලිපි, අන්තර්ජාල තොරතුරු ද්වීතියික මූලාශ්‍ර වශයෙන් ද ගෙන මෙම විමර්ශනය සිදු කෙරේ.

ප්‍රමුඛ පදඃ- පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර, වේවැල්කැටිය ශිලාලේඛනය, හතරවන මිහිඳු රජු, තත්කාලීන අධිකරණය, දඬුවම් ක්‍රම

* සිංහල අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය udayangigarusinhe456@gmail.com